

# පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණය
# ஆய்வு முடிவுகளைப் பகிரங்கப்படுத்தும் மாநாடு
# Conference on Dissemination of Research Findings 2020

## පර්යේෂණ සංක්ෂිප්ත, විධායක සංක්ෂිප්ත සහ ව්‍යාපනය කළ සංක්ෂිප්ත සමඟ ප්‍රත්‍යවේක්ෂණ

## ஆய்வுச்சுருக்கம், ஆய்வுமுடிவுகளின் சுருக்கம், விரிவுபட்ட என்பவற்றை வெளிப்படுத்துதல்

## Abstracts, Executive Summaries, Extended abstracts and Reflections


පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, පර්යේෂණ සැලසුම් සහ සංවර්ධන පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය
ஆய்வானது, கலைத்திட்ட உருவாக்கத்திற்கும் வாண்மை, விருத்திக்கும் அடித்தளமாக அமைகின்றது, தேசிய கல்வி நிறுவகம்
Department of Research and Development, Faculty of Research, Planning and Development, National Institute of Education


<Design / sanka / NIE MEDIA/>

# National Conference on Dissemination of Research Findings 2020

**Department of Research and Development**
**National Institute of Education**
**Maharagama**

**National Conference on Dissemination of Research Findings - 2020**

First Edition – 2020

© National Institute of Education

Printed by: Press
National Institute of Education
Maharagama
Sri Lanka
www.nie.lk

# National Conference on Dissemination of Research Findings - 2020

| | | |
|---|---|---|
| Overall Guidance | Dr. Sunil Jayantha Nawarathna<br>Director General | |
| Guidance | Dr. D. Keppetigoda<br>Director | |
| Co-ordinator | Dilhanie Hettige<br>Lecture | |
| Project Team | Dilhanie Hettige | - Lecture |
| | W. K. S. Pushpamala | - Senior Lecture |
| | N. D. Disanayake | - Senior Lecture |
| | K. A. N. S. Alexander | - Senior Lecture |
| | M. D. D. I. de Silva | - Assistant Educationalist |
| | H.A.S. Nidesh | - Assistant Lecture |
| | V.J. Karunanayake | - Assistant Lecture |
| Supportive Staff | Nilmini Fernendo<br>(Management Assistant) | |
| | Vipula J. Liyanage<br>(Management Assistant) | |
| | N.P. Nisansala Jayarani | |
| Cover page Design | Chatura Madusanka<br>(Department of Electronic Dissemination) | |

## Director General's Message

We all live in an era more than ever in the history of human civilization where the knowledge generated through research, in particular, educational research have become indispensable in enhancing living standards of all human beings. In this context, the role of academics and researchers play an important role in helping build the nation through research that affect positively on almost every aspect of human life.

Researchers achieve their academic goals in conducting academic research through sheer hard work and their academic output is assessed on the basis of generation of new knowledge which positively impact on general public. In other words, research becomes valuable to the extent that it will positively affect living standards of all mankind. One way that research positively impact on enhancing living standards of masses is that policy makers take policy decisions based on sound research findings which will have beneficial effect of the people. To make this possible, researcher should be provided with a platform where they can disseminate their research to the nation. As the National Institute of Education (NIE), is mandated for conducting, disseminating and promoting educational research, NIE has reorganized this kind of conferences since its establishment, 1986.

The national conference on disseminating educational research findings-2020 was organized by the Department of Research and Development, to facilitate academics and researchers in their research endeavors.

I take this opportunity to thank all those academics who have contributed their valuable research, though sheer hard work, conforming strictly to accepted values and ethical considerations. I also wish to thank the Director and all academic and non-academic staff of the Department of Research and Development, for making this annual event a success.

**Dr. Sunil Jayantha Nawarathna**
Director General
National Institute of Education
2020-11-12

## Director's Message

Dissemination of Research findings of the Department is not new and it has been in the history of The Department since its inception in 1987. Dissemination Seminar-2020 is conducted by the Department of Research & Development with the participation of about 40 researchers who have conducted their research studies covering many aspects of burning educational issues prevailing in the system. Educational issues are not limited to a certain period of time; it has been in the system over the years in many different forms. Education today is specially challenging as this is the time that Sri Lanka attempts to reach the status of upper income country. In this endeavor, it is important that we have an education system with both internal and external efficiency contributing to the socio-economic development of the country. Research studies presented today will be very helpful in the process of making fruitful policy decisions for the development of the nation, and therefore, I wish to thank all those who have contributed to make this event a success.

First of all, I would like to thank Director General of NIE, Dr. Sunil Jayantha Nawarathna, for her guidance, motivation and for providing institutional support to make this event a reality.

Next, I would like to thank Prof. Narada Warnasuriya, Former Dean of the Faculty of Medicine for delivering the key note address despite his very busy schedules.

The role played by Dr. Godwin Kodituwakku, former Director, Department of Research and Development is gratefully

acknowledged for reviewing abstracts and providing guidance towards the success.

I would like to express my heartfelt gratitude to the researchers who have submitted research abstracts to this seminar. I would also like to thank all the academic officers Ms. Shirani Pushpamala (Senior Lecture), Mrs. N.D. Disanayake (Senior Lecture), Mrs. K.A.N.S. Alexander (Senior Lecture), Ms. M.D.D. Irani de Silva (Assistant Educationalist), Ms. V.J. Karunanayake (Assistant Lecture), Mr. H.A.S. Nidesh (Assistant Lecture), and the non-academic Staff Mrs. P. Nilmini Fernando, Mr. V.J. Liyanage, Mrs. N.P.N. Jayarani of the Department who have helped in various ways especially at times of difficulty in making this effort a reality.

Finally, I would like to thank, Mrs. Dilhanie Hettige, Lecturer, at the Department of Research & Development for her hard work in coordinating and making all necessary arrangements for the success of this event.

**Dr. Dayananda Keppetigoda**
Director
Department of Research and Development
National Institute of Education
2020.11.12

## Innovative Practices through Educational Research

The role of the teacher in primary and secondary education has changed significantly in the 21st century. Student centered learning has come to the fore. The teacher has become a facilitator of learning and not a mere transmitter of knowledge. She has to be innovative in her approach. Individuality of the teacher is important to achieve success. While the learning outcomes are pre- determined, the methods to achieve them are not. The teacher guides are not binding. They should not exclude innovation. All teachers develop their own ways of connecting with their students and their subjects they do so through reflective practice based on experience and trial and error. Action research is merely a descriptive phrase for this when it is done in a planned and conscious manner.

Research is an important part of scholarship. It is the discovery of knowledge. Discovery, integration, application and teaching complete the cycle of scholarship, A scholarly teacher has to go through all these phases of scholarship to become a complete teacher. It ensures that the knowledge he imparts is not from a stagnant pool but from a running stream.

While research has been considered an essential component of the role of a teacher in university (tertiary) education, the same emphasis has not been placed on research in respect of primary and secondary teachers. However, when they ascend in their academic role from master teacher to teacher trainer and curriculum developer there is more and more emphasis on research.

At this juncture when the dignity, social relevance and the economic value of the teaching profession is being subject to intense scrutiny by society. Emphasis of the innovative knowledge seeking role of the teacher would enable the recognition of teaching as a truly knowledge-based profession on par with medicine and science. Depending on the actual context one is placed in different aspects the cycle of scholarship will be relevant.

This presentation will explore and critically evaluate the need for innovation through research by teachers and also review the presently available modalities to expand the concept, using specific examples. It will examine the relevance of different types of research and how they contribute to scholarship.

**Prof. Narada Warnasuriya**
Senior Professor
Kotelawela Defence University

# Content


| | Page |
|---|---|
| Director General's Message | v |
| Director's Message | vii |
| Key note Address | ix |
| 1. දකුණු පළාතේ කුඩා පාසල්වල පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ක්‍රියාකාරිත්වය | |
| *සුමිත් පරාක්‍රමවංශ,* | 1 |
| 2. දකිමු - හිතමු - අඳිමු | |
| *නදික ජයවිලාල් හේවගේ* | 3 |
| 3. රජයේ හා පෞද්ගලික පාසල් ගුරුවරුන් අන්තර්කරණ අධ්‍යාපනය සංජානනය කරන අයුරු | |
| *කේ. ඒ. දයාශාන්ති කළුආරච්චි* | 5 |
| 4. පන්සිය පනස් ජාතක කතා පොතින් නිරූපිත මෘදු කුසලතා සංවර්ධන සංකල්ප | |
| *අමාලි යසින්තා මුණසිංහ* | 7 |
| 5. ඉගෙනුමට ඉගෙනීමෙන් ඉගෙනුම් පල සාධනීය ලෙස ඉහළ නංවා ගැනීම | |
| *ජේ. සී. ජී. හේවගේ* | 9 |
| 6. ශ්‍රී ලංකාවේ පාසල් නඟා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී පාසල් සංවර්ධන කමිටුවට තීරණ ගැනීම සඳහා හිමි ව ඇති බලතල හා අධිකාරියේ ස්වභාවය | |
| *එස්. ඒ. එච්. සමරසිංහ* | 11 |
| 7. ප්‍රායෝගික දැනුවත් කිරීමේ වැඩමුළු මගින් දෙවන වර්ගයේ පාසල් තුනක අභ්‍යන්තර ප්‍රමිති නියාමනය ඉහළ මට්ටමකට ගෙන ඒම | |
| *එස්. ඒ. පුෂ්පමාලා සමන්කාන්ති ජයමහ* | 13 |

8. තාක්ෂණික යෙදවුම් භාවිතයෙන් සහ ප්‍රයෝගික ක්‍රියාකාරකම්වල නිරත කරවීම මගින් 11 ශ්‍රේණිවල සිසුන්ගේ මූලික ජ්‍යාමිතික නිර්මාණ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම
*ජේ. එම්. සමන්ත ජයසුන්දර* 15

9. කියවීම ප්‍රවර්ධනයෙන් නිර්මාණශීලිත්වය ඔප් නංවමු
*බී. ඒ. ප්‍රියානී බාලසූරිය* 17

10. පශ්චාත් නව යොවුන්වියේ සිසුන්ගේ චිත්තවේගී හැසිරීම් පිළබඳ අධ්‍යයනයක්
*නිශ්ශංක ලියනගේ* 19

11. Enhance Students’ Confidence on Symbolizing Chemical Elements Using Digital Devices
*N. Asha Samarawickrama* 21

12. An Action Rresearch on Improving the Science Marks of Grade 11 Bilingual Students
*N. D. C. S.  Gunathilake* 23

13. Developing the Ability of Creating Dichotomous Keys Based on External Features of Animals
*Madara Jayani Thilakarathne* 25

14. Enhancing the Skill of Reflective Note Writing Among the Prospective Teachers
*Pararajasingam Rajeswaran* 27

15. Classroom Management Techniques Used by Teacher Trainers
*J. D. T. U. K. Jayasingha* 29

16. Improving the Knowledge on Dichotomous Keys through Creative Science Activities
*U. W. Disna Tharangani Wijesiri* 31

17. Improve Mathematics Term Test Marks by Developing Mathematical Terminology and Enjoying It
*B. D. Shalini Silva* 33

18. Improving French Language Essay Writing Skills Using Strategies of the 21st Century Core Skills
*K. D. Kankanamge* 35
19. How Can Identifying Relief Features of Asian Continent be Improved Among Grade Nine Students
*R. A. M. N. Ranatunga* 37
20. Effects of E-Learning Teaching in Accounting Subject for G.C.E (A. L.) Students in Sri Lanka School System
*Dr. S. K. Prabaharan* 39
21. Improving the Knowledge Related to Human Body Systems in Grade 11 Students
*Udani Anjana Nandasiri* 41
22. Examination Stress in War Affected School Students
*Krishnasamy Iynkaran* 43
23. Promoting Bilingual Education (BE) Leaners' Comprehensive in Health & Physical Education using Technical Terms, Through CLIL
*Ayoma Damayanthi* 45
24. Principals' Perception to Engage in Quality Assurance Process in Sri Lankan Schools
*S. M. L. K. Senevirathne* 47
25. Improving Questionability and Answering Ability of Grade 6 Bilingual Learners
*S. A. M. S. Semasinghe* 49

**Research Abstracts of Grantees – 2017**

1. Factors Influencing on Implementation of E-Learning for Teaching and Learning at Schools in Northern Province
*I. Kailasapathy* 53
2. Activity Based Teaching Methods to Arouse the Interest of Students in Primary Mathematics
*I. S. K. Eriyagama* 55

3. Developing a Task Oriented Instructional Approach for Enhancing Attainment of Secondary Students in English in Sri Lanka
*Dr. A. M.Jazeel* 57


## Research Abstracts of Department of Research and Development

1. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශ සහ පෙළපොත්වල බෝ නොවන රෝග හා සබැඳි විෂය අන්තර්ගතය
*ඩබ්. කේ. ශිරානි පුෂ්පමාලා ඇතුළු පිරිස* 61
2. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම්වල පවතින තත්ත්වය පිළිබඳ අධ්‍යයනය
*දිල්හානී හෙට්ටිගේ ඇතුළු පිරිස* 63
3. ශ්‍රී ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව හැදෑරීම සඳහා විෂයධාරාව තෝරා ගැනීම
*එන්. ඩී. දිසානායක ඇතුළු පිරිස* 65
4. යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සබැඳි මත විමසුම
*කේ. ඒ. එන්. එස්. ඇලෙක්සැන්ඩර් ඇතුළු පිරිස* 67
5. පාසල් ළමයින් සිය දිවි නසා ගැනීම පිළිබඳ අධ්‍යයනය
*එම්. ඩී. ඩී. අයිරානි ද සිල්වා* 70

1

# දකුණු පළාතේ කුඩා පාසල්වල පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ක්‍රියාකාරිත්වය

***සුමිත් පරාක්‍රමවංශ***
*නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)*
*දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ඉහළ ඩික්සන් පාර, ගාල්ල*
*දුරකථන: 071-3797075 ; e-mail: sumichamp@hotmail.com*
***කේ. ඒ. ජේ. ආශනි කොඩිතුවක්කු***
*සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)*
*දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ඉහළ ඩික්සන් පාර, ගාල්ල*
*දුරකථන: 071-8374927 ; e-mail: ashanikaj@gmail.com*

සිසුන් අඩු සංඛ්‍යාවක් ඉගෙනුම ලබන ගම්බද හෝ අවාසිදායක පරිසරවල පිහිටි කුඩා පාසල් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට සුවිශාල දායකත්වයක් සපයයි. පාසලේ කළමනාකරණ සහ අධ්‍යාපන ව්‍යවහාර පිළිබඳ ගැටලු පාසල අභ්‍යන්තරයෙන් ම විසඳා පාසලේ ගුණාත්මක සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා වූ පාසල් නඟා සිටුවීමේ වැඩසටහන 2010 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට එක සේ හඳුන්වා දුන් නමුත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කුඩා පාසල්වල ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක බව පෙනී ගොස් ඇත. එබැවින් කුඩා පාසල්වල පාසල් නඟා සිටුවීමේ වැඩසටහනේ ක්‍රියාකාරිත්වයට බලපාන සාධක, ක්‍රියාත්මක කිරීමේ දී මතු වී ඇති දුෂ්කරතා සහ ඒවා ජය ගැනීමට පාසල විසින් යොදා ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග අධ්‍යයනය කර පාසල් නඟා සිටුවීමේ වැඩසටහන කුඩා පාසල්වල ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණ අරමුණ විය. ස්තරායන අහඹු නියැදි ක්‍රමයෙන් දකුණු පළාතේ එක් එක් අධ්‍යාපන කලාපයේ සිසුන් 100ට අඩු කුඩා පාසල් සංඛ්‍යාවට සමානුපාතික වන පරිදි පාසල් 161ක නියැදියක් තෝරා ගන්නා ලදි. විස්තරාත්මක සමීක්ෂණ ක්‍රමවේදය උපයෝගී කර ගෙන නියැදියේ පාසල්වල විදුහල්පතිවරුන් වෙත ප්‍රශ්නාවලියක් ලබා දී රැස් කර ගත් දත්ත විශ්ලේෂණයෙන් කුඩා පාසල්වල පාසල නඟා සිටුවීමේ වැඩසටහන මධ්‍යම මට්ටමේ කාර්යසාධනයක් අත් කර ගෙන ඇති බව අනාවරණය විය. පාසලේ ගුරු සංඛ්‍යාව අනුව වැඩසටහනේ කාර්යසාධනයේ වෙසෙසි වෙනසක් පවතී. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී එම පාසල් මානව

සම්පත සහ කළමනාකරණය සම්බන්ධ දුෂ්කරතාවලට මුහුණ දී ඇති අතර ඒ සඳහා පාසල විකල්ප කළමනාකරණ ක්‍රියාමාර්ග යොදා ඇත. කුඩා පාසල් සංවර්ධනය පිණිස විශේෂ මූල්‍යාධාර සැපයීම, කලාප නියෝජිතයාගේ සුසාධ්‍යකරණ භූමිකාව ශක්තිමත් කිරීම සහ ඔවුන්ට පුහුණු අවස්ථා ලබා දීම, පාසල්වල වැඩසටහනේ ක්‍රියාකාරිත්වය මාසික ව සමාලෝචනය කිරීම පර්යේෂණ යෝජනා වේ.

**මුඛ්‍ය පද:** පාසල් නගා සිටුවීමේ වැඩසටහන, කුඩා පාසල්, කළමනාකරණ ගැටලු

## 2

# දකිමු - හිතමු - අඳිමු

***නදික ජයවිලාල් හේවගේ***

*ශ්‍රී ලංකා ගුරු සේවය 2-II*

*කු/පිලැස්ස මහා විද්‍යාලය, කුරුණෑගල*

*දුරකථන: 071-4584047 ; e-mail: pisuru038@gmail.com*

පරිසරයේ පවත්නා වස්තු සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කිරීමට සිසුන් තුළ ඇති හැකියාව මැන බැලීම පර්යේෂණයේ අරමුණ විය. සෑම ශ්‍රේණියක ම සිසුන් තුළ තලයට ගැළපෙන සේ පරිමාණානුකූල ව භාණ්ඩ සමූහයක් රේඛාවෙන් ඇඳීමේ දී විෂයයේ සිද්ධාන්ත භාවිත කිරීමේ දුර්වලතා හඳුනා ගතිමි. හැකියාව මත නොව විකල්ප විෂය තෝරා ගැනීම් අවසානයේ චිත්‍ර විෂයය තෝරා ගනු ලබන සිසුන් ඇතුළු ව විෂයයට අදාළ උපකරණ සතු නො වන සිසුන් 50%ට වැඩි පිරිසක් විය. මෙම සිසුන් මෝස්තර, සැරසිලි වැනි සරල චිත්‍ර සිතුවම් කිරීමට රුචිකත්වයක් දැක්වුව ද, විවිධ ස්වභාවික හා නිර්මිත වස්තු වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කර රේඛාවේ විවිධතා, ත්‍රිමාණ ලක්ෂණ, එළිය අඳුර භාවිත කරමින් දළ සටහන් ඇඳීමට හෝ පරිමාණය, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ හා එළිය අඳුර, සමබරතාව, තලය භාවිතය, වයනය යන මූලික සිද්ධාන්ත අනුගමනය කිරීමට දැක්වූයේ නොහැකියාවකි. පර්යේෂණයේ දී අවධානය යොමු වූ 11 වන ශ්‍රේණියේ සිසුන් හයදෙනා සහ අනෙක් සිසුන්ට අදාළ ව, නිදර්ශන චිත්‍රවලින් ඇස ගැටෙන ලෙස පංති කාමරය සැරසුවෙමි. ඒවායේ චිත්‍රමය ලක්ෂණ සාකච්ඡා කළෙමි. එදිනෙදා හමුවන ඝනක, ඝනකාභ, ගෝලාකාර වස්තූන් ඒවායේ චිත්‍රමය ලක්ෂණ මතුවන සේ පැන්සල භාවිතයෙන් ඇඳීමට යොමු කළෙමි. තුන්වන පියවර ලෙස සිසු හැකියා අගය කරමින් අඳින ලද විවිධ වස්තූන්ගේ ගතික බව මතු වන සේ වර්ණ ගැන්වීමට අවස්ථාව ලබා දුනිමි. හතරවන පියවර ලෙස ඇඳීමට තබන ද්‍රව්‍යයන්ගේ කෝණය වෙනස් කරමින් තනි ව ද්‍රව්‍ය සම්පිණ්ඩනය ඇඳීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු සැලකිල්ලට ගනිමින්, ද්‍රව්‍ය සමූහයක් රේඛාවෙන් අධ්‍යයනය කරමින් වර්ණ ගැන්වීමට අවස්ථාව ලබා දුනිමි. පස්වන පියවර ලෙස සිසුන් පළමු පියවරේ සිට අඳින ලද සිතුවම් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දී සිසු කුසලතා අගය කරමින් පාසල් මට්ටමෙන් සහතික පත් ප්‍රදානය කළෙමි.

පර්යේෂණයේ අනාවරණ අනුව, සතතාභ්‍යාස චිත්‍ර විෂයයේ මූලික සිද්ධාන්ත හුරුවීමට අත්‍යවශ්‍ය ය. චිත්‍ර ගුරුවරයා විෂය සිද්ධාන්ත හොඳින් අවබෝධ කර ගත්තකු විය යුතු ය. ප්‍රායෝගික ලෝකයේ හමු වන වස්තුන් චිත්‍රණය කිරීම ප්‍රායෝගික පරිසරය තුළ ම සිදු කළ හැකි ය. "අනෙක් සෞන්දර්ය විෂයවලට වඩා පහසු චිත්‍ර ඇඳීමයි" යන මතය වෙනුවට තමා වඩාත් කැමති ම විෂයයක් ලෙස චිත්‍ර කලාව තෝරා ගන්නා පිරිස වැඩි කිරීමෙන් සිසු සාධනය වර්ධනය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** චිත්‍ර විෂයය, පරිමාණානුකූල ව, සිද්ධාන්ත භාවිතය

# 3

# රජයේ හා පෞද්ගලික පාසල් ගුරුවරුන් අන්තර්කරණ අධ්‍යාපනය සංජානනය කරන අයුරු

***කේ. ඒ. දයාශාන්ති කළුආරච්චි***
*කථිකාචාර්ය*
*හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම*
*දුරකථන: 077-5976294 ; e-mail: dayashanthi2@gmail.com*

සැමට අධ්‍යාපනය යන්නෙහි සැබෑ අරුත වන්නේ කිසි ම අයුරකින් හෝ වෙනස් කර සැලකීමෙන් තොර ව සියලු ම ළමයින්ට අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්තා සැලසීමයි (Aniscow, 2009). Miles (2009) ට අනුව පාසල් පද්ධතියට ඇතුළත් වුව ද ගුණාත්මක අධ්‍යාපනයක් නොලබා පාසලේ රැඳී සිටිමින් අවම සාධන මට්ටමක් පෙන්නුම් කරන සහ පාසලින් ඇද හැලෙන ශිෂ්‍ය කණ්ඩායම්, ආර්ථික වශයෙන් පොහොසත් මෙන් ම දුප්පත් රටවල ද සිටියි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල ද, සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින බව විවිධ වාර්තා සහ පර්යේෂණ අනාවරණ අනුව පැහැදිලි වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ වාර්තාව (2004) ද මේ පිළිබඳ ව සඳහන් කර ඇත. සියලු ම පාර්ශ්වයන්ට ගුණාත්මක අධ්‍යාපනයක් හිමි කර දීමට සමත් හොඳ ම විකල්පය "අන්තර්කරණ අධ්‍යාපන" සංකල්පය බව ගෝලීය ප්‍රජාව ද පිළිගෙන ඇත. අන්තර්කරණ අධ්‍යාපනය යනු කුමන හේතු නිසා හෝ අධ්‍යාපනයෙන් ඉවත් කරලීමට ලක් වූ පුළුල් පරාසයක විහි දී ඇති දරුවන් අධ්‍යාපනයට සක්‍රිය ව සහභාගී කර ගැනීමයි. ශ්‍රී ලංකාව ද අද වන විට අන්තර්කරණ සංකල්පය ක්‍රියාවට නංවමින් පවතින රටකි. අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය අනුව ප්‍රධාන වගකිය යුතු පුද්ගලයා බවට පත් වී ඇත්තේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වී සිටින ගුරුවරුන් ය. එම නිසා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ රජයේ පාසල් හා පෞද්ගලික පාසල් ගුරු සංජානනය පිළිබඳ සොයා බැලීම ප්‍රධාන අරමුණ වූ අතර ගුරු සිසු අන්තර්ක්‍රියා සිදු වන ආකාරය සහ සිසු ඉගෙනුම් වාතාවරණය පිළිබඳ ව සොයා බලන ලදි. නියැදිය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ රජයේ පාසල් ගුරුවරුන් 30ක් සහ පෞද්ගලික පාසල් ගුරුවරුන් 30ක් තෝරා ගන්නා ලදි. ගුරුවරුන් සමග කළ සම්මුඛ

සාකච්ඡා සහ ඔවුන් 60 දෙනාගේ පන්ති කාමර නිරීක්ෂණයෙන් ලබා ගන්නා දත්ත සංසන්දනාත්මක ව හා විස්තරාත්මක ව විශ්ලේෂණය කරන ලදි. අධ්‍යයන අනාවරණ අනුව ඉගෙනුම් සහාය අවශ්‍ය සිසුන් ඉගෙනුම් ක්‍රියාවලියට දක්වන සහභාගිත්වයේ විවිධතා දක්නට ලැබුණු අතර ගුරුවරුන්ගේ වෘත්තීය දැනුම, පුහුණුව, පුම්තිරි බව, අත්දැකීම් ගුරු සංජානනය සමඟ ප්‍රබල ව බලපෑම් කරන ලදි. විශේෂයෙන් පෞද්ගලික පාසල්වල ඉගෙනුම් සහාය අවශ්‍ය සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රධාන ම පදනම වී ඇත්තේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ වීම නොව සමාජගත වීම පමණකි. එම පාසල්වල බොහෝ ගුරුවරුන්ට ඇත්තේ අවම සුදුසුකම් සහ අඩු පළපුරුද්දකි. මෙය ද ගුරු සංජානනය කෙරෙහි ප්‍රබල ව බලපෑම් කර ඇත.

**මුඛ්‍ය පද:** සංජානනය, අන්තර්කරණ අධ්‍යාපනය, ගුරුවරුන්

## 4

# පන්සිය පනස් ජාතක කතා පොතින් නිරූපිත මෘදු කුසලතා සංවර්ධන සංකල්ප


***අමාලි යසින්තා මුණසිංහ***

*ශ්‍රී ලංකා ගුරු සේවය 3 I*

*බප/කො/ක්ලිෆ්ටන් බාලිකා විද්‍යාලය, මරදාන*

*දූරකථන: 071-3712331 ; e-mail: amaliyasintha51@gmail.com*



පුද්ගල අන්තර් ක්‍රියාකාරීත්වයට, වෘත්තීයමය කාර්ය සාධනය හා සාර්ථකත්වයට, පුද්ගලයන් වශා කර ගන්නා සමත්කම් හෙවත් කුසලතා මෘදු කුසලතා වේ. පන්සිය පනස් ජාතක කතා පොතෙහි අන්තර්ගත මෘදු කුසලතා සංවර්ධන සංකල්ප හඳුනා ගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. වර්තමාන මානව සමාජයට, මෘදු කුසලතා විෂය ක්ෂේත්‍රය, ජාතක කතා පදනමින් හඳුන්වා දීම හා මෘදු කුසලතා සංවර්ධනයේ වැදගත්කම පෙන්වා දීම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු විය. මෘදු කුසලතා අතුරින් ඉගෙනුම ආශ්‍රිත කුසලතා, සන්නිවේදන කුසලතා, නායකත්ව කුසලතා, සමාජ සදාචාර කුසලතා, පුද්ගල සංවර්ධන කුසලතා හා අධ්‍යාත්මික සංවර්ධන කුසලතා පිළිබඳ ව අවධානය යොමු කෙරිණි. "පාසල් විෂය නිර්දේශවල උපයෝගි කර ගනු ලබන ජාතක කතා" යන ආරම්මන ගත නිර්ණායකය අනුව, ජාතක කතා හයක් නියැදිය ලෙස තෝරා ගෙන, එහි අන්තර්ගතය විශ්ලේෂණය කරන ලදි. ඉගෙනුම ආශ්‍රිත කුසලතා සංවර්ධනය සඳහා නන්දි විසාල ජාතකය ද (ආචාරශීලිත්වය සුහද සම්බන්ධතා ගොඩනගා ගැනීමට උපකාරී වීම, ආවේගශීලී අදහස් ප්‍රකාශනයෙන් වැළකීම), සන්නිවේදන කුසලතා සඳහා සේරිවාණිජ, මච්ඡරිය කෝසිය හා කිසාගෝතමී ජාතක කතා ද (ආත්ම විශ්වාසය ඉහළ නැංවීම, අදහස් හා සිතිවිලි මනා ව සන්නිවේදනය කිරීමට අවශ්‍ය කලාව හඳුන්වා දීම, වචන තුළ ඇති බලය හඳුනා ගැනීමට ඇති හැකියාව, ජීවිතයේ වටිනාකම් වර්ධනය කර ගැනීම), නායකත්ව කුසලතා සඳහා නලපාන ජාතකය ද (පොදු ඉලක්කය වෙත කණ්ඩායම මෙහෙය වීම, ආදර්ශ සැපයීම, කාලය හා ශ්‍රමය වැය කිරීම, නිවැරදි තීරණ ගැනීම, විශ්වාසවන්ත බව ඇති කර ගැනීම, අරක්ෂාව හා වගකීමෙන් යුතු ව කටයුතු කිරීම), සමාජ සදාචාර කුසලතා සඳහා කිසාගෝතමී හා නන්දි

විසාල ජාතක ද (දොස් නැඟීමෙන් වැළකීම, අවශ්‍යතා ඇති පුද්ගලයන්ට උපකාර කිරීමට ඉදිරිපත් වීම), පුද්ගල සංවර්ධනය සඳහා පටාචාරා ජාතකය ද (හැඟීම් පාලනය කර ගැනීම, නිසි තීරණ ගැනීම, යහපත් සබඳතා වර්ධනය), ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා මච්ඡරිය කෝසිය හා කිසාගෝතමී ජාතක ද (නිෂ්ඵල සෘණාත්මක සිතිවිලි හා සන්තාපයන් මෙනෙහි කිරීමෙන් වැළකීම, භාවනා සහ තමා වෙත අවධානය යොමු කිරීමට හැකි ක්‍රියාකාරකම්වල නිරත වීම) යොදා ගත හැකි ය. ජාතක කතා අවසානයේ ඇති උපදේශ ඔස්සේ මිනිස් ජීවිත ක්‍රියාකාරීත්වයට සම්බන්ධ පණිවුඩයක් අන්තර්ගත කිරීම මගින්, මෘදු කුසලතා සංවර්ධනයේ වැදගත්කමත් ජාතක කතා මිනිස් පිවිතයේ එක්තරා අංශයක් පමණක් නොව, සැම අංශයක් ම විග්‍රහ කරන සදුපදේශ රැගත් සාහිත්‍යාංගයක් බවත් පැහැදිලි වේ. මේ අනුව අනාගතයේ දී, ශිෂ්‍යයන්ගේ මෘදු කුසලතා සංවර්ධනය සඳහා භාවිත කළ හැකි පන්සිය පනස් ජාතක කතා විෂයමාලා ද්‍රව්‍යවලට ඇතුළත් කළ හැකි ය.

**මුඛ්‍ය පද:** පන්සිය පනස් ජාතක කතා පොත, මෘදු කුසලතා, සංවර්ධන සංකල්ප

## 5

## ඉගෙනුමට ඉගෙනීමෙන් ඉගෙනුම් පල සාධනීය ලෙස ඉහළ නංවා ගැනීම

***ජේ. සී. ජී. හේවගේ***
*ගුරු උපදේශිකා*
*දෙනුවර කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව*
*දුරකථන: 071-8088009 ; e-mail: jcghewage@gmail.com*

වර්තමාන පන්ති කාමරයේ සම්පත් පාදක ඉගෙනුම් රටාවකට වඩා සිදු වන්නේ ගුරු කේන්ද්‍රීය ශිල්ප ක්‍රමයකි. ඒ ගුරුවරයා කියවන දෙයට ශිෂ්‍යයා සවන් දී මතක තබා ගෙන දෙන ලද පැවරුමකට පිළිතුරු ලබා දීමෙන් ලකුණු ලබා ගන්නා ක්‍රමයකි. එහෙත් ශිෂ්‍යයා විෂයානුබද්ධ පොත් කියවා ගැටලුවලට පිළිතුරු දීමේ විධිමත් වැඩපිළිවෙළක් වර්තමාන පන්ති කාමරයේ නැති තරම් ය. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ විෂයානුබද්ධ පොත් පත් විධිමත් ලෙස කියවා ගැටලුවලට පිළිතුරු ලිවීමේ දී, සාර්ථක ස්වනිර්මාණයක් සිසුවා ලබා දෙන්නේ ද පිළිබඳ ව සොයා බැලීමකි. මේ සඳහා තෝරා ගත් පාසලක නව වන ශ්‍රේණියේ අහඹු ව තෝරා ගත් සිසුන් 10 දෙනෙකුගේ නියැදියක් පර්යේෂණයට ලක් කරන ලදි. ඉතිහාසය විෂයයට අදාළ ව දෙන ලද ගැටලුවට පිළිතුරු ලබා දීමේ දී පෙළපොතට අමතර ව අඩු ම වශයෙන් මූලාශ්‍ර පහක්වත් භාවිත කළ යුතු බව ද, ඒ සඳහා SQ3R ක්‍රමය භාවිත කළ හැකි බව ද, ((S හෙවත් මතුපිටින් කියවීම (survey), Q හෙවත් ප්‍රශ්න තනා කියවීම (question), R හෙවත් තනා ගත් ප්‍රශ්න සඳහා පිළිතුරු සෙවීමට කියවීම (read), එම පිළිතුරු ධාරණය කර ගැනීම (recite), පිළිතුරු අමතක නම් නැවත කියවා තේරුම් ගැනීම (review)) පැහැදිලි කළෙමි. මේ සඳහා පාසලේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය භාවිත කළ හැකි බවට ද උපදෙස් දෙන ලදි. සවිබලකරණ ආදර්ශ අට වශයෙන් හඳුන්වන ගැටලුව හඳුනා ගැනීම, තොරතුරු ගවේෂණය, තේරීම, සංවිධානය, නිර්මාණය, ඉදිරිපත් කිරීම, ඇගයීම, ඉදිරි වෙනත් වැඩවලට යොදා ගැනීම යන කරුණු භාවිත කරමින් ලකුණු දීමේ පටිපාටිය ක්‍රියාත්මක කරන ලදි. මෙහි අරමුණ වූයේ නව ඉගෙනුම් ශෛලීන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම ක්‍රියාත්මක කිරීම ය. මෙම ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලියේ පියවර අනුව අනාවරණය වූයේ

නව ශෛලීන්ට අනුව පිළිතුරු ලිවීමට සිසුන් ඉගෙනගෙන ඇති බවත්, සිසු ආකල්ප හා ගුරු ආකල්ප වෙනස් වී ඇති බවත්, පාසල් පාදක ඇගයීම්වල දී හා වාර විභාගවල දී සිසුන් සාර්ථක ලෙස පිළිතුරු ලියා සාධන මට්ටම වැඩි කර ගෙන ඇති බවත් ය. මෙයින් නිගමනය කළ හැක්කේ, ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාලය භාවිත කරමින්, නවීන ඉගෙනුම් ක්‍රම අනුව විෂයානුබද්ධ පොත් පත් විධිමත් ලෙස කියවීමට සිසුන් පුහුණු කරවීමෙන් ශිෂ්‍ය සාධන මට්ටම වැඩි කර ගත හැකි බව ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී, සිසුන්ගේ අවබෝධාත්මක කුසලතා සංවර්ධනයට බලපාන ගැඹුරු සංකල්ප වන කියවීම ඉගැන්වීම කෙරෙහි ගුරුවරයා අවධානය යොමු කළ යුතු ය.

**මුඛ්‍ය පද:** සිසුන්, කියවීම, ඉගෙනුමට ඉගෙනීම

6

# ශ්‍රී ලංකාවේ පාසල් නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී පාසල් සංවර්ධන කමිටුවට තීරණ ගැනීම සඳහා හිමි ව ඇති බලතල හා අධිකාරියේ ස්වභාවය

*එස්. ඒ. එච්. සමරසිංහ*
*කථිකාචාර්ය*
*ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම*
*දුරකථන: 071-8433382 ; e-mail: sahhadasan@gmail.com*

පාසල් පාදක කළමනාකරණ (School Based Management-SBM) වැඩසටහන 2000 දශකයේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දුන්න ද, 2006 වර්ෂයේ සිට මෙම සංකල්පය ශ්‍රී ලංකාවේ පාසල් නගා සිටුවීමේ වැඩසටහන ලෙස 2005/24 චක්‍රලේඛයෙන් හඳුන්වා දෙමින් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ගුණාත්මක බව ඉහළ නැංවීම, වැඩසටහන හඳුන්වා දීමේ මූලික අරමුණ විය. පාසල් නගා සිටුවීමේ වැඩසටහන, අංක 8/2010 චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකාවේ සියලු ම පාසල්වල ක්‍රියාත්මක විය යුතු වේ. මෙම අධ්‍යයනයේ පරමාර්ථය, පාසල් සංවර්ධන කමිටුවට තීරණ ගැනීම සඳහා හිමි ව ඇති බලතල හා අධිකාරියේ ස්වභාවය විමසා බැලීම ය. මෙහි දී 7/2013 චක්‍රලේඛයේ සඳහන් තේමා හය, පංච ලක්ෂ්‍ය පරිමාණයක් අනුව ප්‍රමාණනය කරමින් එක් එක් තේමාව සම්බන්ධයෙන් පාසල් සංවර්ධන කමිටුවට කොපමණ බලතල හාතීරණ ගැනීම සම්බන්ධයෙන් අධිකාරිත්වයක් හිමි ව ඇද්දැයි විමසා බැලිණි. පර්යේෂණ අරමුණු විමසා බැලීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කෙරිණි. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ නියමාවලි හා ලිඛිත මූලාශ්‍ර දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස භාවිත කෙරිණි. නියැදිය, අධ්‍යාපන කලාප දෙකක පාසල් 24ක, පාර්ශවකරුවන් 518 දෙනෙකුගෙන් සමන්විත විය. දත්ත විශ්ලේෂණයට ප්‍රතිශත, මධ්‍යන්‍ය අගය හා කයි වර්ග පරීක්ෂාව භාවිත කෙරිණි. අධ්‍යයනයේ අනාවරණ අනුව, තීරණ ගැනීම සම්බන්ධයෙන් පාසල් සංවර්ධන කමිටුවට හිමි ව ඇති බලතල හා අධිකාරිය, පාසල් පිරියත නඩත්තුව හා සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා ඉහළ මට්ටමකුත්, පාසල් ප්‍රාග්ධන වත්කම් කළමනාකරණය ඉතා පහළ

මට්ටමකත් පවතී. ගැටලුවක් සඳහා තීරණ ගැනීමේ දී බහුතර ඡන්දයෙන් තීරණ නොගැනීම, ඇතැම් සැලසුම් පාසල් සංවර්ධන කමිටුවේ නිර්දේශ ලබා නොගෙන ක්‍රියාත්මක වීමේ අවස්ථා පවතී. තීරණ ගැනීම සම්බන්ධයෙන් ස්වාධීනත්වයක් අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ ව පර්යේෂණයේ දී විමසන ලද අතර ඒ අනුව පාසල් පිරියත නඩත්තුව හා සංවර්ධනය, විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවර්ධනය සම්බන්ධයෙන් ඉහළ ස්වාධීනත්වයක් ඇත. පාසලේ සැලසුම් සකස් කිරීමට පාසල් සංවර්ධන කමිටුව සම්බන්ධ වීමේ දී පාසල් වර්ගය අනුව වෙනස්කම් පවතී. මේ අනුව විදුහල්පති ආකල්ප සංවර්ධනය සහ වැඩසටහන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කළ යුතු ය. මේ සඳහා පොකුරු පුහුණු සැසි වඩාත් ඵලදායී වේ. පාසල් පාදක කළමනාකරණය මගින් ප්‍රජා අවශ්‍යතා හැසිරවීම මූලික අරමුණ වන අතර ඒ සඳහා ජාතික පොදු විෂය නිර්දේශයක් පමණක් ක්‍රියාත්මක වීම බාධාවකි. මේ අනුව අධ්‍යාපන පරිපාලකයින් මේ සම්බන්ධයෙන් මැදිහත්ව පොදු විෂය නිර්දේශය මත ඒ ඒ පාසලට සුවිශේෂ විෂයමාලා සම්පාදනය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ. පාසල් සංවර්ධන කමිටු රැස්වීම් හුදෙක් සහභාගී වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර සක්‍රීය සහභාගීත්වය අවශ්‍ය වේ. මේ සඳහා පාසල් සංවර්ධන කමිටු සියලු සාමාජිකයින් සඳහා සහභාගීත්ව කළමනාකරණය සම්බන්ධයෙන් මනා පුහුණුවක් ලබා දිය යුතු වේ.

**ප්‍රමුඛ පද:** පාසල් පාදක කළමනාකරණය, පාසල් නඟා සිටුවීමේ වැඩසටහන, පාසල් සංවර්ධන කමිටුව

## ප්‍රායෝගික දැනුම්වත් කිරීමේ වැඩමුළු මගින් දෙවන වර්ගයේ පාසල් තුනක අභ්‍යන්තර ප්‍රමිති නියාමනය ඉහළ මට්ටමකට ගෙන ඒම

***එස්. ඒ. පුෂ්පමාලා සමන්කාන්ති ජයමහ***
*නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)*
*කලාප අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල*
*දුරකථන: 071-8255445 ; e-mail: sapsjayamaha@gmail.com*

ශිෂ්‍ය ප්‍රජාව ඉහළ ගුණාත්මක බවින් යුක්ත පිරිසක් බවට පත් කිරීමට පාසල් පද්ධතියෙහි ගුණාත්මක බව තහවුරු කළ යුතු ය. 2015 වර්ෂයේ සිට "අපේ පාසල කෙතරම් ගුණාත්මක ද?" මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව, ප්‍රමිති ක්ෂේත්‍ර අටක්, නිර්ණායක 60ක් හා දර්ශක 210ක් හඳුන්වා අභ්‍යන්තර ප්‍රමිති නියාමනය පාසලෙහි විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම නිර්දේශ කර ඇත. කුරුණෑගල අධ්‍යාපන කලාපයේ බාහිර ප්‍රමිති නියාමනයේ දී අභ්‍යන්තර ප්‍රමිති නියාමනය සිදු නොකළ 2 වර්ගයේ පාසල් තුනක් විය. පළමු ව පාසල තුළ අභ්‍යන්තර ඇගයීම සිදුවීම පිළිබඳ ව වර්තමාන තත්ත්වයත්, දෙවනු ව ප්‍රායෝගික වැඩමුළු දියත් කිරීම හා තෙවනු ව ඒවායේ සාර්ථක අසාර්ථකභාවයත් සොයා බලන ලදි. ගුරුවරුන්ගේ පාඩම් නියාමනය කර තිබුණ ද පාසල් ප්‍රමිති අභ්‍යන්තර අධීක්ෂණය සිදු කර නොතිබුණි. බාහිර හා අභ්‍යන්තර ප්‍රමිති ගුණාත්මක දර්ශක ප්‍රදර්ශනය කර නොතිබුණි. ප්‍රමිති ක්ෂේත්‍රවල වගකීම ද නිසි ලෙස ගුරුවරුන්ට පවරා නොතිබුණි. අභ්‍යන්තර ඇගයීම් දත්ත විශ්ලේෂණය කර සංවර්ධන අවශ්‍යතා වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. ලිපිගොනු සැකසීම ද ඉතා ම අක්‍රමවත් විය. ඒ අනුව මැදිහත් වීමේ පියවර ලෙස කුඩා කණ්ඩායම් වශයෙන් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පතිවරුන් සමඟ ප්‍රමිති ක්ෂේත්‍ර පිළිබඳ ව සාකච්ඡා කරමින් සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍ර පෙන්වා දෙන ලදි. පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 80 ඉක්මවූ පාසල් තුනක විශිෂ්ට ව්‍යවහාරවල අත්දැකීම් ලබා දෙන ලදි. ප්‍රායෝගික අත්දැකීම්වලින් තම පාසලේ ධනාත්මක වෙනසක් කිරීමට පාසල් තුනෙහි විදුහල්පතිවරු එකඟ වූහ. මැදිහත් වීමෙන් පසු පාසල් තුනෙහි ප්‍රමිති ක්ෂේත්‍ර අටෙහි වගකීම් බෙදා දී නියාමනය කර අභ්‍යන්තර ප්‍රමිති දර්ශකය ගණනය කර වාර්තා කිරීම හා ප්‍රදර්ශනය කර තිබුණි. විශිෂ්ට ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම, දෙමාපිය සහාය ඇති ව පිරියත

අලංකරණය, ක්ෂේත්‍ර අටෙහි ම ලිපිගොනු විධිමත් ව සැකසීම, ගුරු සූදානම් සටහන් ද පාඩම් අධීක්ෂණය ද පන්ති වාර්තා පොත් ද විධිමත් වීම, පන්තිකාමර ඉගෙනුම් පරිසර ව්‍යාපෘති, විෂය සමගාමී කටයුතු විධිමත් ව ක්‍රියාත්මක වීම, පෝෂණ වැඩසටහන් වැනි සුබසාධන කටයුතු, පාසල් පුස්තකාලය විධිමත් වීම වැනි බොහෝ දෑ ක්‍රියාත්මක විය. කුරුණෑගල අධ්‍යාපන කලාපයේ දෙක වර්ගයේ පාසල් තුනක, අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI) ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර ප්‍රමිති නියාමනය බලගන්වමින් ගත් ව්‍යායාමයෙන් පාසල් විශිෂ්ටත්වය කරා ළඟා විය.

**ප්‍රමුඛ පද:** ප්‍රමිති, නියාමනය, පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය (SEQI)

# මූලික ජ්‍යාමිතික නිර්මාණ සිදු කිරීමේ සංකල්ප සහ ඒවායේ ප්‍රායෝගික යෙදීම් පිළිබඳ ව පාසලේ 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ගේ අවබෝධය

***ජේ. එම්. සමන්ත ජයසුන්දර***
*ශ්‍රී ලංකා ගුරු සේවය 2 II*
*කු/විජයබා ජාතික පාසල, මහව*
*දුරකථන: 077-4101955 ; e-mail: samanthjsndr123@gmail.com*

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරත ව සිටිය දී සහ පෙර අනාවරණ පරීක්ෂණයකින් ප්‍රත්‍යක්ෂ වූ කරුණක් වූයේ 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ට ජ්‍යාමිතික සංකල්ප පිළිබඳ අවබෝධයක් නොමැති බවයි. එනිසා අරමුණු තුනක්, එනම් ජ්‍යාමිතික සංකල්ප පිළිබඳ නිසි දැනුමක් තාක්ෂණික මෙවලම් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් භාවිතයෙන් සිසුන්ට ලබා දීම, අත්‍යවශ්‍ය මූලික පථ පිළිබඳ නිසි දැනුම ප්‍රායෝගික ව සිසුන්ට ලබා දීම, ජ්‍යාමිතික නිර්මාණවල ප්‍රායෝගික යෙදීම් පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දීම පදනම් කළ ක්‍රියාමූලික පර්යේෂණය සඳහා ජාතික පාසලක 11 වන ශ්‍රේණියේ සිසුන් 37ක් (පිරිමි 16, ගැහැනු 21) සහභාගි කර ගන්නා ලදි. ශිෂ්‍ය අවබෝධය සංවර්ධනයට ජ්‍යාමිතියේ මූලික සංකල්පවලට අදාළ පදවල අරුත් සහිත ශ්‍රව්‍ය දෘෂ්‍ය ඉදිරිපත් කිරීම සහ ලම්භ සමච්ඡේදකය, වෘත්තය, පයිතගරස් සම්බන්ධය, ලම්භකය, කෝණ සමච්ඡේදකය, කෝණ නිර්මාණය, ත්‍රිකෝණ නිර්මාණය, පරිවෘත්තය, අන්තර් වෘත්තය, සමාන්තර රේඛා යන සංකල්ප තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරකම් 10ක් යොදා ගැනිණි. උදාහරණ ලෙස, ලම්භ සමච්ඡේදකය යන සංකල්පය තහවුරු කිරීම සඳහා $A$ හා $B$ පැළ දෙකකට සම දුරින් ජලය සැපයීම සඳහා කානුවක් කැපීමට අදාළ ගමන් මග සලකුණු කිරීමට සිසුන් යොමු කිරීම සහ පරිවෘත්තය යන සංකල්පය තහවුරු කිරීම සඳහා $A, B, C$ වූ මල් පැළ තුනකට සම දුරින් ජලය සැපයීම සඳහා වතුර මලක් පිහිටුවීමට අදාළ ස්ථානය සෙවීමට සිසුන් යොමු කිරීම යන ක්‍රියාකාරකම් කළෙමි. පර්යේෂණයේ දී කළ මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයන්ගේ ජ්‍යාමිතික සංකල්ප පිළිබඳ අවබෝධය වර්ධනය වූ බව පසු පරීක්ෂණයෙන් තහවුරු විය. පන්ති කාමරය තුළ සිදු කරන ගැටලු විසඳීමේ ක්‍රියාවලියට වඩා එළිමහනේ සිදු කරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සිසුන් තුළ දැඩි ඇල්මක් පවතින බවත් එමගින් සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම

පහසු වන බවත් නිගමනය විය. එමෙන් ම කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් සිසුන් තුළ නිසි අවබෝධයකින් යුක්ත වූ තරගකාරිත්වය සහ කණ්ඩායම් හැඟීම වැඩිදියුණු කිරීම මෙන් ම කාර්යක්ෂම ව කටයුතු කිරීම යන ගුණාංග සංවර්ධනය කළ හැකි වේ. තව ද පරිගණකය සහ තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිත කරමින් නිර්මාණාත්මක ව ගණිතමය සංකල්ප ඉදිරිපත් කිරීම මගින් සිසුන්ගේ ආකර්ෂණය ලබා ගනිමින් එම සංකල්ප පිළිබඳ ව මනා අවබෝධයක් ලබා දීමේ හැකියාව පවතී. එමෙන් ම පර්යේෂකයකුට තම ක්‍රියාකාරිත්වය සංවර්ධනය කර ගැනීමට සහ තම සාර්ථකත්වය සඳහා ස්වයං ඇගයුම හා ප්‍රත්‍යවේක්ෂණය ඉතා වැදගත් වේ. මේ අනුව ආකර්ෂණීය සහ අවබෝධාත්මක සංකල්ප සාධනයක් සහිත වූත් දිගු කාලීන මතකයක් ස්ථාපිත වන්නා වූත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ව කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** ජ්‍යාමිතිය, ක්‍රියාකාරකම්, සිසුන්

9

# කියවීම ප්‍රවර්ධනයෙන් නිර්මාණශීලිත්වය ඔප් නංවමු

*බී. ඒ. ප්‍රියානි බාලසූරිය*
*පුස්තකාලයාධිපති*
*ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, කොළඹ*
*දුරකථන: 071-8121903 ; Email: priyabalasooriya@gmail*

පාසල් සිසුන්ගේ කියවීම ප්‍රවර්ධනය සහ නිර්මාණශීලී ලේඛකත්වය වර්ධනය කිරීමට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත වූ අය විවිධ ක්‍රමෝපාය අනුගමනය කරයි. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජාතික පාසලක් පාදක කර මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි. එම පාසලේ ගුරු පුස්තකාලයාධිපති සහ තෝරා ගන්නා ලද සිසු නියැදියට අදාළ ශ්‍රේණිය භාර ගුරුවරයා සහ සිසුන්ට සිංහල විෂයය උගන්වන ගුරුවරයා සමග කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා අනුව සහ පංතිකාමරවල පවතින බිත්ති පුවත්පත් හා ඒවායේ ප්‍රදර්ශනය වන සිසු නිර්මාණ නිරීක්ෂණයෙන් තහවුරු වූයේ සිසුන්ට නිවැරදි ව පොත පත කියවීමට හුරු නොමැති බව, යම් අරමුණකට අනුව කියවීමට නොදත් බව සහ විධිමත් ව බිත්ති පුවත්පතක් පවත්වා ගැනීම පිළිබඳ හුරුවක් නොමැති බව ය. එම නිසා තෝරාගත් පාසලේ නවවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසු සංගහනයෙන් අහඹු ලෙස තෝරා ගනු ලැබූ සිසු සිසුවියන් සියයකගේ (100) නියැදියක් තෝරා ගන්නා ලදි. මෙම තත්ත්වය අවම කර ගැනීමට මැදිහත්වීමේ පියවර ලෙස සිසුන් කණ්ඩායම් තුනකට බෙදා වටමාරු ක්‍රමයට පොතක් නිවැරදිව හඳුනා ගැනීම උදෙසා පොත තාක්ෂණික ව කියවීම, එම පොත ඇගයීම, කියවීමේ මොඩියුලයක් භාවිතයෙන් අරමුණක් උදෙසා කියවීම යන හැකියා වැඩිදියුණු කිරීමට අදාළ ව ක්‍රියාත්මක කරන ලදි. මේ සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී ම පැවරුම්පත් භාවිත කරමින් සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කර ගන්නා ලදි. මෙම ක්‍රියාකාරකම් අවසානයේ කණ්ඩායම් තුනෙහි අභිමතය පරිදි සකස් කර ගන්නා ලද ආකෘතියට අනුව විධිමත් ව බිත්ති පුවත්පතක් නිර්මාණයට මග පෙන්වන ලදි. ඒ අනුව එළඹි නිගමන වූයේ, සිසුන් තුළ පවත්නා දැනුම පමණක් භාවිත කොට සිසුන් තනිව ම ක්‍රියාකාරකම්වල නිරත වීමේ දී එකී පැවරුම් පත් අසම්පූර්ණ හෝ වැරදි පිළිතුරුවලින් යුක්ත වූ අතර, අක්‍රමවත් සහ

නිර්මාණශීලිත්වයෙන් තොර බිත්ති පුවත්පත් නිර්මාණ කර තිබිණි. පසු ව එක් එක් ක්‍රියාකාරකම්වල නිරත වන්නට පෙර ඒ සඳහා සකසා ගත් ඉගෙනුම් ආධාරක භාවිත කර සිසුන් ව දැනුවත් කරමින් එකී ක්‍රියාකාරකමෙහි යෙදවීම නිසා අපේක්ෂිත ඉලක්ක කරා සිසුන්ගේ ක්‍රියාකාරකම් සංවර්ධනය කර ගැනීමට හැකි විය. පාසල් සිසුන්ගේ කියවීමේ රුචිකත්වය ප්‍රවර්ධනයට පොත පත ලබා දීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, එම පොත පත නිවැරදි ව පරිශීලනය කිරීමටත් කියවීමේ විධික්‍රම කියා දීමටත් මැදිහත් විය යුතු ය. එසේ ම කියවූ දෙය ඇගයීමට ලක් කිරීම සහ ඒ තුළින් නව නිර්මාණ බිහි කර සිත් ගන්නා ලෙස රචනා කර ප්‍රදර්ශනය කිරීමට ද හුරු පුරුදු කළ යුතු ය. එවන් කාර්ය පාසල් සිසුන්ට පහසුවෙන් අවබෝධ කරවීමට උපයෝගී කර ගත හැකි වැඩසටහනක් ලෙස කියවීම් කඳවුරු පැවැත්විය හැකි ය.

**ප්‍රමුඛ පද:** කියවීම ප්‍රවර්ධනය, කියවීම් කඳවුරු, කියවීම

## පශ්චාත් නව යොවුන්වියේ සිසුන්ගේ චිත්තවේගී හැසිරීම් පිළිබඳ අධ්‍යයනය

***නිශ්ශංක ලියනගේ***
*අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය*
*දුරකථන: 071-3715826 ; e-mail: nisankaliyanageabcd@gmail.com*
***එනෝකා රන්දෙනිය***
*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය*
*දුරකථන: 071-4467365 ; e-mail: erandeniya_m@yahoo.com*

පශ්චාත් නව යොවුන් වියේ සිසුන් තුළ ජීව විද්‍යාත්මක වෙනසක් සිදු වුව ද එයට සාපේක්ෂ ව ඔවුන් තුළ චිත්තවේග නිසි පරිදි හැසිරවීම සිදු නොවීම නිසා විවිධ චිත්තවේගී ගැටලු ඇති වේ. සිසුන් මෙන් ම ගුරුවරුන් ද මේ නිසා අපහසුතාවන්ට පත් වේ. එම නිසා සිසුන්ගෙන් ප්‍රකාශ වන චිත්තවේගී හැසිරීම් මොනවා දැයි සොයා බැලීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. අද්‍යතන පර්යේෂණයේ නියැදිය ලෙස දෙහිඹිවිට අධ්‍යාපන කලාපයේ පිහිටි 1AB සහ 1C පාසල් යොදා ගනිමින් ස්තරායන සමානුපාතික නියැදීම යටතේ සිසුන් 323 දෙනෙකු සහ ගුරුවරුන් 100 දෙනෙකු යොදා ගන්නා ලදි. මෙහි දී මිශ්‍ර පර්යේෂණ එළඹුමට යටත් ව ප්‍රශ්නාවලි සහ කේවල සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කරන ලදි. රැස් කර ගත් ප්‍රමාණාත්මක දත්ත, ප්‍රතිශත ගණනය කර සංඛ්‍යා වගු හා ප්‍රස්තාර ඔස්සේ ද ගුණාත්මක දත්ත තේමා පාදක කොට ගනිමින් ද විශ්ලේෂණය කෙරිණි. දත්ත විශ්ලේෂණයේ දී සිසුන් ඉගෙන ගන්නා පාසල් වර්ගය, සිසුන්ගේ පුම්තිරි බව, පාසලේ අධ්‍යාපනය ලබන කාලය, පාසලේ දරන තනතුරු, අධ්‍යාපනය ලබන විෂයධාරාව ඔස්සේ චිත්තවේගීය හැසිරීම් සොයා බලන ලදි. පශ්චාත් නව යොවුන්වියේ සිසුන්ගෙන් ප්‍රකාශ වන චිත්තවේගී හැසිරීම් සම්බන්ධයෙන් වූ අනාවරණ අනුව, සිසුන්ගේ චිත්තවේගී චර්යාවන් 1AB පාසල්වල සිසුන්ට වඩා 1C පාසල් සිසුන් ගෙන් ප්‍රබල ව දැකිය හැකි බවත් බහුතර සිසුන් සංඛ්‍යාවක් ප්‍රේම සම්බන්ධතා පවත්වන බවත්, ඇතැම් සිසුන් කිහිප දෙනෙකු සමඟ එකවර සම්බන්ධතා පවත්වන බවත්, සිසුන් වැඩි දෙනෙක් නිල ඇඳුම වැරදි ලෙස භාවිත කිරීම, ජංගම දුරකථන භාවිත කිරීම, පන්ති කාමරවලින් බැහැර ව සිටීම වැනි විනය විරෝධී ක්‍රියාකාරකම්වලට යොමු වී ඇති

බවත්, නව තාක්ෂණය භාවිත කරමින් නව දැනුම සොයා යෑමට කැමැත්තක් දක්වන බවත්, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව සිසුන් තුළ ධනාත්මක හා ඍණාත්මක චිත්තවේගී හැසිරීම් පවතින බවත් අනාවරණය විය. මේ අනුව පශ්චාත් නව යෙවුන්වියේ සිසුන්ගේ චිත්තවේග මනා ව කළමනාකරණයට අවශ්‍ය අත්දැකීම් ලබා දීමට අදාළ පරිසරය ගොඩ නගනු වස් දෙමාපියන් හා ගුරුවරුන් යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

**මුඛ්‍ය පද:** පශ්චාත් නව යොවුන්විය, චිත්තවේග කළමනාකරණය, චිත්තවේගී හැසිරීම්

## 11

## Enhance Students' Confidence on Symbolizing Chemical Elements using Digital Devices

***N. Asha Samarawickrama***
*Sri Lanka Teacher Service*
*MR/ Rahula College, Matara*
*Tele: 077-5719888 ; e-mail: samarawickramanuwanasha@gmail.com*

Students become confused while studying Chemistry lessons when writing chemical symbols of the most commonly using elements in the periodic table. This intends to improve the grade 9 bilingual students' ability of writing and symbolizing the first 20 elements of periodic table with the help of digital devices. Research was focused on difficulties students face when writing symbols of most commonly used elements and how to improve students' ability in naming and writing symbols of elements. Objectives of the intervention programme were to identify the students' difficulties of writing chemical symbols of selected elements, to implement suitable teaching methods to minimize the students' weaknesses on writing chemical symbols, to make students' confidence on naming and writing chemical symbols and to build up students' interest towards learning chemistry. A target group of 12 bilingual students of Grade 9 were the participants.  A questionnaire was administered as the pre test. First intervention was to give the clear understanding about writing chemical symbols with internationally accepted rules. Teacher demonstration was done through power point presentation. As second intervention, the assignments on making poems including chemical symbols and display card chains, group activities such as flash card games through smart phones and making a power point presentations about chemical symbols and out- door activities such as

“snow ball” and ladder chat, to enhance students’ confidence on naming and writing chemical symbols. Finally, a post-test was given and it was found that, remarkable change of students’ progress in symbolizing elements. Use of digital devices while learning was interesting and attractive way to introduce chemical symbols for the children who were in Grade 9. In today’s education system students were attracted towards learning in a joyful manner. Instead of using only the traditional lecture method there is a need of involving students in activities using digital devices.

**Key words:** Elements, Chemistry, Bilingual

## 12

# An Action Research on Improving the Science Marks of Grade 11 Bilingual Students

***N. D. C. S. Gunathilake***

*Sri Lanka Teacher Service 2 II*

*CP/ KOT / Delta Gemunupura Maha Vidyalaya, Pussellawa.*

*Tele: 071-8175149 ; e-mail: gunathilakesagarika@gmail.com*

This action research was conducted in a selected 1AB school in Kotmale zone. When the 3rd term Science answer scripts in Grade 10 Bilingual class were analyzed, it was understood that the marks have to be improved to get good results in Ordinary Level (O.L.) Examination. Grade 10, 3rd term Science marks were taken as the pre-test. Then the reasons to get fewer marks were found out using interviews with the students and parents. It was clear that some important lessons in Grade 10 were not learned in the correct manner. Students were under pressure to memorize all four Science books for O.L. and also the time spent at home on Science subject was not sufficient due to too much of tuition classes, and their lack of commitment at home. Another weakness was not practicing writing answers with Science papers. Objectives of this research were to improve Science marks of grade 11 Bilingual students, to practice writing answers and to reduce the pressure of memorizing four big Science text books for O.L. Examination. A viber group was created to communicate with the parents on extra classes and lessons which the students should learn weekly. Extra classes were allocated to revise Grade 10 work. Additional sessions were arranged to practice writing answers in the given space. Techniques like 'open-ended questions', 'create cartoon strips', 'concept mapping' were

implemented to enhance the writing ability. “Fun with Science” was introduced to reduce their pressure on difficult areas. Resource persons were invited to conduct practical sessions and extra activities to make Science fun. More video clips were used in the Teaching-Learning process. Since peer learning helps vastly in academic work, support of those who performed well in the previous Bilingual O.L. batch were invited to help. Finally, a post-test was given and the data taken from pre and post-tests was analyzed. It was found that there was significant improvement of marks in the post-test of the students who participated the activities regularly.

**Key words:** Writing answers, Fun with Science, Peer learning

**13**

# Developing the Ability of Creating Dichotomous Keys Based on External Features of Animals

***Madara Jayani Thilakarathne***
*Sri Lanka Teacher Service 2 II*
*MR/ St. Servatius College, Matara*
*Tele: 071-8058800 ; e-mail: dilnethmadara@gmail.com*

Dichotomous key is a scientific way of classifying organisms based on their external features. Grade 6 bilingual students face difficulties when classifying organisms based on their external features using dichotomous keys. They do not tend to select the question based on dichotomous keys and obtain relatively low marks. Developing the ability of creating a dichotomous key based on external features of animals was the aim of the research. Objectives were to create the interest of students in observing animals in the surrounding, to develop the awareness of students on animal diversity, to enhance summarizing skills of students by developing terminology related to animals' external features, to develop students' creativity of applying alternative options for unknown terms in dichotomous keys, and to encourage students to obtain high scores for the question related to dichotomous keys. To achieve the objectives, first marks on the question based on dichotomous keys in the 2$^{nd}$ term test of 15 bilingual students in a National School, collected and analysed. To confirm the results four sets of animals were given to classify. Showing video clips including external features of animals, directing students to create models of animals by using natural and discarded artificial things and presenting their features, asking students to create external body parts using clay, and recreational games while names

of the animals and their external body parts, laboratory activity to identify features of given animals, group work with presentations and individual activities based on "21st Century Core Skills" were used as methods. As a result, students' creativity, interest, summarizing skills, confidence and terminology related to dichotomous keys were developed qualitatively and quantitatively. Suggestions to the school system based on the research were; adding more interesting activities to the school syllabus while limiting unwanted theory parts, giving more opportunities for children to test, explore and understand, providing more opportunities for teachers to develop their skills related to 21$^{st}$ century core skills using digital technology and adding more outdoor activities.

**Key words**: Dichotomous keys, Core skills, External features

## 14

# Enhancing the Skill of Reflective Note Writing among the Prospective Teachers

***Pararajasingam Rajeswaran***
*Lecturer*
*Jaffna National College of Education*
*Tele: 077-4658185 ; e-mail: pararajasingamrajeswaran@gmail.com*
***Pon. Ramathas***
*Senior lecturer*
*Dept. of Education, Open University*
***Jeyalaxsumy Rasanayagam***
*Head of the Department*
*Department of Education, University of Jaffna*

An action research on "enhancing the skill of writing reflective note of the prospective teachers" was based on primary prospective teachers of Jaffna National College of Education. Writing reflective notes seems basic for both purposes: for the application of action research which is carried on during the period of teaching practice as well as for the development of the professional skills of the teachers. Evaluating the level of writing skills on reflective note of prospective teachers of primary, finding out the challenges that they face while writing reflective nots and finding solutions for them, planning a framework for improving writing skills regarding reflective notes, evaluating, getting reflections, focusing on solutions were the objectives of the action research. This research put forward considering primary prospective teachers as research population where 20 prospective teachers were selected as the sample focusing the research objectives. To prove the problem of the research, data collection was made through lesson notes written by prospective teachers, checklists, questionnaires, and discussions. Evidences from

literature were used for interference planning frame. The collected data were brought under content analysis and pre-test and post-test analysis. For the betterment of writing skills on reflective notes, through reducing the problems related to above mentioned title, there were six planned interventions implemented. At the end of the action research, an indictable betterment was proved through the reducing percentage of problems from early stage; 80% to 20%, 90% to 30%, 60% to 05% and 80% to 10%. Through this, prioritizing writing reflective notes, introducing special projects are put forward as solutions in the curriculum and teacher education programme as well.

**Keywords:** Reflective notes, Writing, Prospective teachers

**15**

## Classroom Management Techniques Used by Teacher Trainers

***J. D. T. U. K. Jayasingha***
*Lecturer*
*Sariputta National College of Education, Dambadeniya*
*Tele: 072-0239423 ; e-mail: jayasinghaupekshika@gmail.com*

Education contributes massively for economical development of the individual in the society. Sri Lankan government reserves a large allocation of funds for a fruitful education with modern technology and expects successful results. In the education chain school can be nominated as the most important node and the teacher is the valuable character as the process is carried out in the classroom. Classroom management is very important for the success of teaching learning process. National Colleges of Education act as the leader in the teacher training field and the out-put of that teacher gives more than 25 years of service for the system. Two years residential training and a year internship practice is compulsory to complete the National Diploma in Teaching. This study was aimed at investigating the use of classroom management techniques used by prospective teachers when completing the internship period. This is a mixed methods study where both quantitative and qualitative approaches were used. A sample of 40 perspective teachers, 10 lecturers & 10 mentor teachers were selected from 10 schools. The data were collected using observations, interviews & questionnires. Quantitative data were analyzed using Ms-excel and qualitative data were subjected to thematic analysis. It was revealed that student teachers practiced the classroom management rules that were learnt as theories and also, they were satisfied with the college of education syllabus. Moreover,

it was found that they like very much if they get more chances to practice the theories within the first two years of the course with more guiding from lecturers. Therefore, by giving more chances to practice the theories with guiding may solve most of the problems that they faceduring the classroom management.

**Keywords:** National College of Education, Teacher Trainies, Classroom Management Techniques

**16**

# Improving the Knowledge on Dichotomous Keys through Creative Science Activities

***U. W. Disna Tharangani Wijesiri***
*Sri Lanka Teacher Service 2 II*
*Pl/ Diwlankadawala Central College, Diwlankadawala*
*Tele: 070-2108885 ; e-mail: disnawijesiri@gmail.com*

Problem was identified when analyzing the second term test paper as 15 students out of 25 had not selected the question based on dichotomous keys, which is a scientific way of classifying organisms based on their external features. The aim of the research was to improve the achievement level of students based on dichotomous keys. Through this I wanted students to be good observers of the environment and to build up dichotomous keys, considering the external features. To achieve the objectives, four interventions with ten activities were implemented. First intervention was an awareness programme to inform parents and to get permission for after school sessions as it was difficult to manage school time with lengthy syllabus. Second intervention was an evaluation paper as the pre-test to get an idea about the level of knowledge. Based on the reflections and data analyzed in the second intervention, activities were implemented during third intervention as to give enjoyable learning experiences. Activities were watching videos related to diversity of organisms, filling exploration sheets through field visits, building up dichotomous keys as competitive group works, creating booklets on diversity of organisms, engaging in creative fun games which were related with 21st century core skills. At the end of activities again the same evaluation paper was given as the post-test. Quantitatively 21

